# චතාරික සමයේ දෙවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ජෙරමියා දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ජෙරමියා 17 : 5-10

**"මිනිසා කෙරෙහි විශ්වාසය තබන්නා ශාප ලද්දෙකි. දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තබන්නා ආසිරි ලද්දෙකි."**

සමිඳාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. "මිනිසුන් කෙරෙහි විශ්වාසය තබන, මිය යන සුළු සිරුර ශක්තිය කරගෙන, සමිඳුන් කෙරෙන් හැරී ඉවත්ව යන මිනිසා ශාප ලද්දෙකි. ඔහු පාළුකරයෙහි ඇති පඳුරකට සමාන වේ. යහපත පැමිණි විට එය ඔහුට නොපෙනේ. පාළුකරයෙහි වියළි තැන්හි, මිනිසුන් නොවසන ලුණු බිම්හි ඔහු වාසය කරයි. සමිඳුන් කෙරෙහි විශ්වාසය තබන, සමිඳුන් තරයේ විශ්වාස කරන මිනිසා භාග්‍යවන්තයෙකි. ඔහු ගං ඉවුරේ සිටුවා ඇති ගඟටම මුල් ඇද ඇති ගිම්හානයට කිසි බියක් නැති, කොළ පරවී යාමක් නැති, නියඟ කාලය ගැන කරදර නැති, නොනැවතී දිගටම පලදාවක් ඇති ගසක් හා සමාන වේ. අනි කිසිවකට වඩා සිත කපටි ය. හැම අතින් ම එය දූෂණය වී ඇත. එය තේරුම් ගත හැක්කේ කාටද? සමිඳුන් වන මම මිනිසාගේ සිත සෝදිසි කර බලමි. මිනිසාගේ හදවත පරීක්ෂා කර බලමි. එසේ කරන්නේ මිනිසාගේ හැසිරීම අනුව ඔහු ජීවත් වන පිළිවෙළ ලෙස ඔහුට විපාක දෙන පිණිස ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 1 : 1-4, 6

පිළිතුර: සමිඳුන් කෙරෙහි අදහන තැනැත්තේ ආසිරි ලද්දෙකි.

ගීය:

දුදනන් උපදෙස් අනුව නොයන, දෙවිඳුන් ගරහන්නන් ඇසුරු නොකරන සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේය.

ඔහු ඇළ දොළ අද්දර සිටුවා ඇති, නියම කලට පල දරන, කොළ පරව් නොයන ගසකට සමාන ය. ඔහු කරන සැම දේ සරුසාර වේ.

පව්ටු දනෝ එසේ නොවෙති. ඔව්හු සුළගේ යන බොල් හා සමාන වන්නෝය. දමිටුන් හට සමිඳාණෝ සරණ වන සේක.
පව්ටුන්ගේ මාර්ගය විනාශයට යන්නේය.

## සාධුකාරය

"ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි ජේසුස් ස්වාමින් වහන්සේ වදාළ සේක."

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 16: 19–31

***"ඔබ ජීවත්ව සිටිය දී හැම සැපත ම ඔබට තිබුණි. දැන් ඔහු සැනසිලි ලබයි. ඔබ දහදුක් විඳින්නෙහි ය."***

"අගනා නිල රක්ත වස්ත්‍ර හා සිනිඳු සේද රෙදි හැඳගත්, හැමදා සැප විහරණයෙන් කල් යැවූ එක් ධනපතියෙක් විය. ඔහුගේ නිවසේ දොරටුව ළඟ ඇඟ පුරාම වණ තිබූ ලාසරස් නම් එක් හිඟන්නෙක් ගෙනවුත් තබන ලදි. ඔහු ධනපතියාගේ කෑම මේසයෙන් වැටෙන කැබලිවලින් වූ ද සාගිනි නිවා ගැනීමට සතුටු විය. බල්ලෝ පවා ඔහුගේ වණ ලෙව කෑවෝය. ඒ හිඟන්නා මිය ගිය පසු දේව දූතයන් විසින් ඔහු ආබ්‍රහම් ළඟට ගෙන යන ලද්දේය. ධනපතියාත් මැරී භූමදාන කරන ලද්දේය. ඔහු ආත්ම භවනෙහි වද විඳිමින් ඇස් ඔසවා ආබ්‍රහම් ද ඔහුගේ තුරුල්ලේ හුන් ලාසරස් ද දුරින් දැක, මොරගසා, ආබ්‍රහම් පියතුමනි, මට කරුණා කොට තම ඇඟිලි තුඩ දියේ ගල්වා මාගෙ දිව තෙමාලන පිණිස ලාසරස් එවනු මැනව. මන්ද, මම මේ ගිනි ජාලාවෙහි දහ දුක් විඳිමි"යි කීය. එහෙත් ආබ්‍රහම් පිළිතුරු දෙමින් "පුත්‍රය ඔබ ජීවත්ව සිටිය දී, හැම සැපත ම ඔබට තිබුණු බව ද එලෙස ම හැම විපත ම ලාසරස්ට තිබුණු බව ද සිහි කරන්න. එහෙත් දැන් ඔහු මෙහි සැනසිලි ලබයි. ඔබ දහදුක් විඳින්නෙහිය. එපමණක් නොවේ මොබින් ඔබ වෙත යාමට වත්, ඔබින් අප වෙත ඒමට වත් කැමති වූවන්ට එය කළ නොහැකි වනසේ ඔබ හා අප හා අතර පරතරයක් පිහිටුවා ඇතැ"යි කීය. එවිට ධනවතා "එසේ නම් පියතුමනි මාගේ සහෝදරයෝ පස් දෙනෙක් සිටිති. ඔවුන් ද මේ වද වේදනා ඇති ස්ථානයට නොපැමිණෙන පිණිස ඔවුන්ට අවවාද දෙන්නට ලාසරස් මාගේ පියාගේ

ගෙදරට යවන මෙන් ඉල්ලමි"යි කීය. එහෙත් ආබ්‍රහම් කතා කොට "මෝසෙස් සහ දිවැසිවරයෝ ඔවුන්ට සිටිති. ඔව්හු ඔවුන්ට සවන් දෙත්වා" යි කීය. ඔහු කතා කොට "එසේ නොවේ ආබ්‍රහම් පියතුමනි, මළවුන් කෙරෙන් එකකු ඔවුන් වෙත ගියොත් ඔවුන් මනස්ථාපනය වනු ඇතැ"යි කීය. ආබ්‍රහම් පිළිතුරු දෙමින් "ඔව්හු මෝසෙස්ටත් දිවැසිවරයන්ටත් සවන් නොදෙත් නම්, මළවුන්ගෙන් උත්ථානයට පැමිණියකු වුව ද ඔව්හු විශ්වාස නොකරති"යි ඔහුට කීය.

සුවිශේෂ වාක්‍යය එසේ ය.